# රට නැඟුමට එක්කළ යුතු තරුණයා

රටක සංවර්ධනමය ප්‍රයත්න යන් විෂයෙහි තරුණයින් විසින් ඉටුවිය යුතු කාර්යභාරය ඉතා විශාලය. ජීව විද්‍යාත්මක වශයෙන් ගත් කළ ඔහුගේ කායික ශක්තිය මෙන්ම බාහිර ලෝකය පිළිබඳව පොත පත ඇසුරින් මෙන්ම සමාජ වෙනස්වීමේ සාධකයන් තුළින්ද බොහෝ දේ ඇසූපිරූ තරුණයා රටේ සංවර්ධන කාර්යයේදී සහභාගි කරවා නොගැනීම අතිශයින්ම ශෝක ජනක කටයුත්තක් ලෙස සැලකිය හැක. මෙම තත්ත්වයට බොහෝ සෙයින්ම වගකිය යුතු වන්නේ එම සංවර්ධන ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සාදන ඒවාම ක්‍රියාවට යොදන පිරිස් සහ වැඩිහිටි ප්‍රගතියයි. තරුණයින් හිතුවක්කාර කොටසක්ය. ඔවුන්ට වගකීම් පැවරීම භයානක ප්‍රතිඵල ගෙන දෙන සුළුය. ඔවුන්ගේ අත් දැකීම් අල්පය ආදී වශයෙන්

විශේෂයෙන් තරුණයින්ගේ අදහස් ආකල්ප රටාව මෙන්ම වෙනස් සමාජ අවශ්‍යතා ඔහු තේරුම් ගන්නා ආකාර යත් ඔහුගේ අධ්‍යාපන රටාව හා ජීව විද්‍යාත්මක වශයෙන් ඔහුගේ කායික ශක්තිය තුළින් ඔහු ලබා ඇති අභිමානයත් විද්‍යාත්මක අයුරින් තේරුම් ගැනීම තරුණයින් සංවර්ධන කාර්යන් වෙත සහභාගි කරවා ගැනීමේදී අතිශයින් වැදගත් වේ. විශේෂයෙන් අද තරුණයින්ට දෙස් පවරන වැඩිහිටියන් තමන් විසින්ද තරුණ ජීවිතයක් ගත කල බව ඉතා ලෙහෙසියෙන් අමතක කොට ඇත. මේ අනුව තරුණයා හා වැඩිහිටියා අතර ආකල්පීය වශයෙන් මෙන්ම සමාජ අවශ්‍යතා වශයෙනුත් එක්තරා පොදු සමානාත්මතාවයකට මේ දෙපිරිස කැඳවීම හා සහභාගි කරවා ගත හැකි නව මං සෙවීම රටක සංවර්ධන කාර්යයේදී ඉතා වැදගත්වේ.

තරුණයින් පිළිබඳව පූර්ව වැරදි නිගමනයක සිටින මෙම කොටස් මහා සමාජයේ සංවර්ධනමය කාර්යන් වෙත තරුණයින් සහභාගිකරවා ගැනීමට නිරන්තර මැලිකමක යෙදේ. මෙය එක් අතකින් තරුණයාගේ බුද්ධිමය ශ්‍රමය මෙන්ම කායික ශ්‍රමයද අපතේ යැවීමක් වන අතර මේ නිසා තරුණ අසහනය මෙන්ම තරුණයින්ගේ ආවේගකාරී ස්වරූපයද ඉස්මතුවී පෙනේ. ඔහු පාරම්පරික අදහස් විනාශකර දැමීමට යුහුසුළු වන බව බොහෝ රටවල් ඇසුරින් තේරුම් ගත හැක.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 1980 දී පමණ ගල්ගමුව ගොවිජන සේවා කම්ටු ප්‍රදේශය තුළ හඳුන්වා දුන් "සුළු ගොවි සංවර්ධන ව්‍යාපෘතියේ" මහජන සහභාගිත්වය විෂයෙහි තරුණයින්ගේ කාර්යභාරය එම ව්‍යාපෘතියට නොලැබීමට හේතුව කුමක්දැයි පර්යේෂණාත්මකව කරුණු සොයා බැලීමේදී හෙළිවූ කරුණු කිහිපයක් මෙහිදී සාකච්ඡාවට භාජනය කිරීමට කැමැත්තෙමි.

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි
ජී. ඩී. ආර්. කුමාරසිරි
විසිනි.



සංවර්ධනයට සහභාගිවූ තරුණයින් පිරිසක්.

විශේෂයෙන් මෙම ව්‍යාපෘතියේදී ගොවි සංවිධාන පිහිටුවීමට තෝරාගත් නායකයින් වූයේ විදනේවරු සහ කෘෂිකාර්මික කටයුතු කෙරෙහි වැඩි අවබෝධයක් ඇති වැඩිහිටි ගොවීන්ය. එක් පැත්තකින් මේ අය ගමේ වැඩි දෙනාගේ ඡන්දයෙන් පසුව දේශපාලනික වශයෙන් බලවත් අයවූ අතර මොහුගේ පත්වීම ගොවිජන සේවා පනත මගින් තහවුරු කරන ලදී. නව වෙල් විදනේ ක්‍රමය යටතේ පත්වූ මේ අය සවා පැරණි විදනේ වරු මෙන්ම පාරම්පරික අදහස් ගරු කිරීම වෙනස්වන සමාජ අවශ්‍යතා හා තරුණයින්ගේ ආකල්ප රටාවන් තේරුම් නොගැනීම මෙන්ම තේරුම් ගැනීමට උනන්දුවක් පවා නොදක්වීම නිසා තරුණ ගොවීනි මේ ව්‍යාපෘතියට සහභාග වූයේ ඉතාම අල්ප වශයෙනි. නායකයින් වශයෙන් කටයුතු කරන විදනේවරු පැරණි විදනේ ක්‍රමය තුල ගම් වැසියන් ඒ අයට දක්වූ සමාජ තත්ත්වය ගරු බුහුමන් ආදිය ගැන කනස්සල්ලෙන් යුතුව කතාකළා වීනා ගම්තුල සිදුවන කෘෂිකාර්මික කටයුතු වලදී මෙන් සමාජ සංවර්ධන කටයුතු වලදීද තරුණයින් සහභාගි කරවා ගතහැකි මාධ්‍යයක් ගැන උනන්දු නොවීය.

මුළු ගල්ගමුව ගොවිජන සේවා කම්වූ ප්‍රදේශය ගත්කල 30% ක් පමණ තරුණ ගොවීන් සිටි නමුත් ඔවුන් ඒ ඒ ප්‍රදේශයේ ගොවි සංවිධාන මාසික රැස්වීම වලට සහභාගි වූයේ අල්ප වශයෙනි. කෘෂිකාර්මික කටයුතු කෙරෙහි තරුණ ගොවීන්ගේ ඇති දැනුම අල්ප වශයෙනි. කෘෂිකාර්මික කටයුතු කෙරෙහි තරුණ ගොවීන්ගේ ඇති අල්ප දැනුම ගැන වැඩිහිටි ගොවීන් කතාකල අතර තරුණයින් විසින් වැඩිහිටි ගොවීන් අනුගමනය කරන පාරම්පරික, යල්පැනගිය කෘෂිකාර්මික ක්‍රම පිළිබඳව කතාකළේ උපහාසාත්මකවයි.

විශේෂයෙන් තරුණයා සංවර්ධනමය ප්‍රයත්නයන් විෂයෙහි සහභාගි කරවා ගැනීමට ඇති තවත් බාධකයන් ලෙස මේ ව්‍යාපෘතිය ඇසුරින් දුටු කරුණක් නම් තරුණයා යටත් විජිත ක්‍රමය විසින් හඳුන්වා දුන් අධ්‍යාපන ක්‍රමය තුලින් හික්මීමක් ලැබූවකු වීමයි. මෙහිදී ප්‍රධාන කරුණු දෙකක් බලපෑවේය. එක් පැත්තකින් එවැනි අධ්‍යාපන ක්‍රමය ලැබූ තරුණයා තම දෙමව්පියන්ගේ කෘෂිකාර්මික කටයුතු වලට සහභාගි වීමට මෙන්ම එය ප්‍රධාන ව්‍යාපෘතිය වශයෙන් තෝරා ගැනීමටද මැලිකමක් දක්වීය. විශේෂයෙන් අධ්‍යාපනය ලැබූ තමන්ගේ දරුවා කෘෂිකර්මාන්තය රැකියාවක් වශයෙන් තෝරා ගනීම දෙමාපියන් ප්‍රිය නොකළ අතර එයම එක් අතකින් සිංහලයා ජාතියක් වශයෙන් බටහිර අධිරාජ්‍ය වාදයට ගොදුරු වීමෙන් සිදුවූ සංස්කෘතික විපර්යාසයක් ලෙස පෙන්වා දිය හැකිය. එහෙත් එම බටහිර ක්‍රමයට අනුව සකස්වූ අධ්‍යාපන ක්‍රමය ලැබූ තරුණයාගේ බුද්ධිය උරාගත හැකි සංවර්ධනමය ප්‍රයත්නයක් මේ දක්වා අප රටතුල දැකිය හැකි වන්නේ අල්ප වශයෙනි. ඒ නිසා නිරන්තරයෙන්ම සංවර්ධනයට යෙදිය හැකි තරුණ ශ්‍රමයත් විරැකියාවෙන් පෙළීම දක්නට ලැබේ.

මේ අනුව තමන් උපත ලැබූ සංස්කෘතිය තමා පිළිගැනීමට සූදානමක් නැති අතර තමන් අධ්‍යාපනය ලැබූ සංස්කෘතිය තමන්ගේ උගත්කම ප්‍රයෝජනයට නොගන්නා බැවින් තරුණයා මේ සංස්කෘතීන් දෙක අතර අතරමංවීම සිදුවේ. මේ නිසා නිරන්තර තරුණ අසහනය පවතින සමාජ ක්‍රමයට තරුණයා ද්වේශ කිරීම මෙන්ම සම සමාජ වටපිටාව කඩා දමා ඉදිරියට යාමට තරුණයා උනන්දු වීම අනිවාර්ය ලක්ෂණයක් බව සුප්‍රකට ඇමරිකානු සමාජ විද්‍යාඥයෙකු වූ සී. රයිට් මිල්ස් වරක් පවසා ඇත.

සංවර්ධනය කාර්යයන් වෙත තරුණයින් සහභාගී කරවා ගැනීම භයානක කරුණක් වශයෙන් පැවසීම අද යල්පැනගිය අදහසකි. සංවර්ධනමය කටයුතු විෂයෙහි ඔවුන් සහභාගි කරවා ගත හැකි මාධ්‍යයන් මොනවාදැයි විද්‍යාත්මකව තේරුම් ගත යුතුය. විශේෂයෙන් තරුණයින්ගේ අදහස් ආකල්ප රටාව මෙන්ම වෙනස් සමාජ අවශ්‍යතා ඔහු තේරුම් ගන්නා ආකාරයත් ඔහුගේ අධ්‍යාපන රටාව හා ජීව විද්‍යාත්මක වශයෙන් ඔහුගේ කායික ශක්තිය තුලින් ඔහු ලබා ඇති අභිමානයත් විද්‍යාත්මක අයුරින් තේරුම් ගැනීම තරුණයින් සංවර්ධන කාර්යයන් වෙත සහභාගි කරවා ගැනීමේදී අතිශයින් වැදගත්වේ. විශේෂයෙන් අද තරුණයින්ට දෙස් පවරන වැඩිහිටියන් තමන් විසින්ද තරුණ ජීවිතයක් ගත කළ බව ඉතා ලෙහෙසියෙන් අමතක කොට ඇත, මේ අනුව තරුණයා හා වැඩිහිටියා අතර ආකල්පීය වශයෙන් මෙන්ම සමාජ අවශ්‍යතා වශයෙනුත් එක්තරා පොදු සමානාත්මතාවයකට මේ දෙපිරිස කැඳවීම හා සහභාගි කරවා ගතහැකි නව මං සෙවීම රටක සංවර්ධන කාර්යයේදී ඉතා වැදගත් වේ.